# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1813/15 - 2013 ජුනි මස 05 වැනි බදාදා - 2013.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ජුනි මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග අපනයන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) නියෝග යනුවෙන් හැඳින්වේ.

2. 2013.04.29 වැනි දිනැති අංක 1808/6 දරන *අතිවිශේෂ ගැසට් නිවේදනය* මෙයින් අවලංගු කරනු ලබන අතර එම නිවේදනය නැවත මෙම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ.

3. පහත උපලේඛනයේ I වැනි තීරයේ දක්වා ඇති භාණ්ඩ, එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූපී සටහනේ දක්වා ඇති අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල වන්නේ නම් මිස කිසිම තැනැත්තකු එම ද්‍රව්‍ය අපනයනය කරනු නොලැබිය යුතු ය.

4. සෑම අපනයනකරුවෙක් විසින්ම, තමා විසින් අපනයනය කරනු ලබන එක් එක් භාණ්ඩය සම්බන්ධයෙන් එම භාණ්ඩය පරීක්ෂා කිරීම සඳහා බලයලත් පරීක්ෂණාගාරයකින් හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පිළිගනු ලබන පරීක්ෂණාගාරයකින් නිකුත් කරන ලද එම භාණ්ඩය සඳහා නියම කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිතිය සහිත අනුකූලතා සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

5. සෑම අපනයනකරුවෙකු විසින්ම, ඔහු විසින් අපනයනය කරනු ලබන එක් එක් භාණ්ඩය සම්බන්ධයෙන්, එම නිශ්චිත භාණ්ඩය පරීක්ෂා කිරීම සඳහා බලයලත් පරීක්ෂණාගාරයකින් හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පිළිගනු ලබන පරීක්ෂණාගාරයකින් ලබාගත් අනුකූලතා සහතිකය ලබාදීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන නිෂ්කාශන සහතිකය ලබාගත යුතු ය.

6. උපලේඛනයේ දක්වා ඇති යම් භාණ්ඩයක් අපනයනය කරන සෑම අපනයනකරුවෙකු විසින්ම, නියම කරනු ලබන පරිදි අපනයනය කරන එක් එක් තොගයේ ද්‍රව්‍ය සහ සාම්පල් වලට අදාළ සියලුම ලේඛන සමඟ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන නිෂ්කාශන සහතිකය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට (රේගු නිෂ්කාශනයට පෙර) ඉදිරිපත් කළ යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7. මෙම නියෝගය යටතේ ආවරණය කරනු ලබන භාණ්ඩයක් (භාණ්ඩ) සකස් කිරීම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් දක්වා ඇති තක්සේරු පරිපාටියට සහ මාර්ගෝපදේශවලට අනුකූලව තක්සේරු කළ යුතු ය.

8. මෙම නියෝගය යටතේ ආවරණය කරනු ලැබූ භාණ්ඩ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ කිරීමට නිෂ්කාශන සහතිකයක් ලබාදී ඇති විටක හැර, කිසිම අපනයනකරුවෙකු අපනයනය කරනු නොලැබිය යුතු ය.

9. මෙම නියෝග 2014 ජනවාරි මස 01 වැනි දින සිට බල පැවැත්වේ.

## උපලේඛනය

| *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *අනුක්‍රමික අංකය* | *I වැනි තීරය ද්‍රව්‍ය* | *II වැනි තීරය ශ්‍රී ලංකා ප්‍රමිති* |
|---|---|---|---|
| | 01 | කුඩු නොකරන ලද හෝ අඹරනු නොලැබූ කුරුඳු | ශ්‍රී ලංකා ප්‍රමිති 81 2010 කුරුඳු සඳහා පිරිවිතර |
| 0906.11.10 | | කාබනික | |
| 0906.11.11 | | කපන ලද කුරු කි. ග්‍රෑම් 1 හෝ ඊට අඩු සිල්ලර ඇසුරුමකින් සහ ඇසුරුම් පෙට්ටිවල | |
| 0906.11.12 | | වෙනත් කුරු | |
| 0906.11.13 | | කුරු | |
| 0906.11.14 | | පැතලි කොටස | |
| 0906.11.15 | | පතුරු | |
| 0906.11.91 | | කපන ලද කුරු කි. ග්‍රෑම් 1 හෝ ඊට අඩු සහ ඇසුරුමකින් සහ ඇසුරුම් පෙට්ටිවල | |
| 0906.11.92 | | වෙනත් කුරු | |
| 0906.11.93 | | කුරු | |
| 0906.11.94 | | පැතලි කොටස | |
| 0906.11.95 | | පතුරු | |
| 0906.20.10 | | කුඩු කරන ලද කුරුඳු | |
| 0906.20.20 | | අඹරණ ලද කුරුඳු | |

06- 469

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.